## සත්‍යර්ත කැමැත්ත අර්ථ නිරූපණය

සත්‍යර්ත කැමැත්ත යනු ලිංගික ක්‍රියාවක යෙදීම සඳහා එයට අදාළ සියලුම පාර්ශවයන් දැනුවත්ව, ස්ව-කැමැත්තෙන් සහ පොදුවේ එකඟ වූ තීරණයකි. අදාළ කැමැත්ත වාචිකව හෝ ක්‍රියාවෙන් පළ කල හැකි අතර එම වචන හෝ ක්‍රියාවන් ලිංගික ක්‍රියාවලියක නිරත වීම සඳහා පැහැදිලි අවසරයක් ලබාදෙයි. නමුත්, නිහඬතාවය හෝ විරුද්ධත්වය පල නොකිරීම හෝ මගින් කැමැත්ත පළකිරීමක් ලෙස පිළිනොගැනේ. ත්‍යර්ත කැමැත්ත අර්ථ නිරූපණය ලිංගික ක්‍රියාවට සහභාගී වන පුද්ගලයාගේ ලිංගිකත්වය, ලිංගික දිශානුයෝජනය, ලිංගික අනන්‍යතාවය හෝ ලිංගික භාව ප්‍රකාශනය මත වෙනස් නොවේ.

පාර්ශව අතර හෝ වෙනත් පාර්ශවයක් සමග යම් ලිංගික කාර්යයකට පල කල කැමැත්ත හෝ ඊට පෙර කැමැත්ත සහිතව සිදු කල ලිංගික ක්‍රියාවලියක් මගින් ඉන් පසු වෙනත් ලිංගික ක්‍රියාවලියකට කැමැත්ත ලැබුනා සේ සැලකිය නොහැක.

අදාළ පුද්ගලයා මත් ද්‍රව්‍ය හෝ මද්‍යසාර වල බලපෑම යටතේ සිටියදී වුවද ඕනෑම ලිංගික කාර්යයකට කැමැත්ත අවශ්‍ය වේ.

ආරම්භයේදී කැමැත්ත ප්‍රකාශ කලද ඕනෑම අවස්ථාවක එය වෙනස් කිරීමේ හැකියාව ඇත.

අදාල පුද්ගලයා අශක්නුකෘත අවස්ථාවක කැමැත්ත ලබා ගත නොහැක. ඊට හේතුව එවන් අවස්ථාවක් ඇතිවන්නේ අදාළ පුද්ගලයට දැනුවත්ව ලිංගික කාර්යයක යෙදීමට තීරණයක් ගත නොහැකි වීමයි. අශක්නුකෘතභාවය ඇතිවීමට මනා සිහියෙන් නොසිටීම, නින්දේ පසු වීම, බලහත්කාරයෙන් රඳවාගැනීම හෝ අදාල පුද්ගලයාට කැමැත්ත පල කළ නොහැකි අවස්ථාවක් බල පා හැකිය. එමෙන්ම මත් ද්‍රව්‍ය හෝ මද්‍යසාර වල බලපෑම, විෂ ශරීර ගත වීම ආදී අවස්ථාවල කැමැත්ත පල කල නොහැකි අශක්නුකෘතභාවය ඇති විය හැක.

බලහත්කාරය, තර්ජනය, බලපෑම් හා බිය ගැන්වීම් වල ප්‍රථිපලයක් ලෙස කැමැත්ත ලබා දිය නොහැක.

ලිංගික කාර්යයක් අතරතුර කැමැත්ත ඉවත් කර ගත හොත් හෝ තව දුරටත් කැමැත්ත පල කල නොහැකි අවස්ථාවක අදාල ක්‍රියාව අත්හිටුවිය යුතුය.

## මත්ද්‍රව්‍ය හා මද්‍යසාර භාවිතය මත වූ ක්‍රියාවන් සඳහා සමාව

Rockland Community College හි ඕනෑම ශිෂ්‍ය/ශිෂ්‍යාවකගේ සෞඛ්‍යය හා ආරක්ෂාව ඉතා වැදගත් වේ. RCC විසින්, ගෘහස්ත හිංසනය, සහකරුට හිංසනය, රහසින් හඹායෑම හෝ ලිංගික බලහත්කාරය ආදිය ද ඇතුලත්ව එමෙන්ම අනෙකුත් ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියාව සිදුවූ අවස්ථාවේ මද්‍යසාර පානය කරමින් සිටි හෝ මත්ද්‍රව්‍ය භාවිතා කරමින් සිටි සිසුන් (අදාළ භාවිතය කැමැත්ත මත සිදු වූ හෝ නොවුවද) අදාළ ක්‍රියාව නිසි බලධාරීන්ට දැන්වීමෙන් තමන්ට දඬුවම් ලැබේ යැයි බියෙන් එය දැන්වීමෙන් වැලකි සිටිය හැකි බව හඳුනා ගනී. එබැවින්, RCC ගෘහස්ත හිංසනය, සහකරුට හිංසනය, රහසින් හඹායෑම හෝ ලිංගික බලහත්කාරය ආදි ක්‍රියාවන් නිසි බලධාරීන්ට දැන්වීමට ශිෂ්‍ය/ශිෂ්‍යාවන් උනන්දු කිරීමට පෙළඹේ. නමුත්, තුන්වන පාර්ශවයක් විසින් ගෘහස්ත හිංසනය, සහකරුට හිංසනය, රහසින් හඹායෑම හෝ ලිංගික බලහත්කාරය යනාදී ක්‍රියාවක් පිළිබඳව සද්භාවයෙන් RCC හි බලධාරීන්ට හෝ පොලිසියට දැනුම්දීම මත එම අවස්ථාවේ හෝ ප්‍රචණ්ඩත්වය සිදු වූ අවස්ථාවට අසන්න අවස්ථාවක අදාල පුද්ගලයා විසින් මද්‍යසාර පානය කරමින් සිටි හෝ මත්ද්‍රව්‍ය භාවිතා කරමින් සිටියේ නම් එය RCC's හි ගෘහස්ත හිංසනය, සහකරුට හිංසනය, රහසින් හඹායෑම හෝ ලිංගික බලහත්කාරය යනාදී ක්‍රියාවක් පිළිබඳව ආචාර්ය ධර්ම සංග්‍රහයට යටත් නොවේ.

## ශිෂ්‍ය හිමිකම් පත්‍රිකාව

සියලුම ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට පහත දෑ සඳහා අයිතිය ඇත:

ප්‍රාදේශීය හා/හෝ පළාත් නිසි බලධාරීන්ට පොලිසියට වාර්තා කිරීම;

ගෘහස්ත හිංසනය, සහකරුට හිංසනය, රහසින් හඹායෑම හෝ ලිංගික බලහත්කාරය යනාදීන්ට අදාල අනාවරණය කිරිම් වලට නිසි ක්‍රියාමාර්ග ඉල්ලා සිටීම;

ආයතනයේ බලපෑමකින් තොරව අපරාධයක් හෝ ප්‍රචණ්ඩ ක්‍රියාවක් පිළිබඳව විනය කමිටුවක් හමුවේ, අධිකරණය හවුමේ හෝ අපරාධ විමර්ශන ක්‍රියාවලියකදී අනාවරණය කරනවද නැද්ද යන්න තීරණය කිරීම;

සාධාරණ, පක්ෂපාති නොවූ, අර්ථානුකූල, නිසියාකාර අවස්ථාවකට සම්බන්ධ වීම;

නිසි ගරුත්වය ලැබීමටත්, ආයතනය විසින් සපයන්නේ නම් සාධාරණ, ගෞරවශීලි සෞඛ්‍ය පහසුකම් හා මාර්ගෝපදේශන ලබා ගැනීම;

අදාල ප්‍රචණ්ඩත්වයට වරදකරු වූ පුද්ගලයා පිළිබඳව වාර්තා කල හැකිව තිබූ වෙනත් ක්‍රම එම ප්‍රචණ්ඩත්වය වලක ගත හැකිව තිබූ ක්‍රම හෝ ඒ පිළිබඳව යෝජනා හෝ වලට ඇහුම්කන් නොදීම;

අදාල සිද්ධිය ආයතනයේ නිසි බලධාරීන්කිහිප දෙනෙකු හමුවේ පමණක් ප්‍රකාශ කිරීමටත් එම සිද්ධිය නැවත නැවත ප්‍රකාශ කිරීමෙන් වැලකි සිටීම.

චූදිත පුද්ගලයාගේ පවුලේ පුද්ගලයන්, මිත්‍රයන් අදාල පුද්ගලයන් වෙනත් සිසුවෙකු හෝ ආයතනය විසින් සිදු කල හැකි විරෝධතා වලින් ආරක්ෂාව ලබා ගැනීම;

අවම වශයෙන් එක් අභියාචනයකට සහභාගිවීම;

අදාල ක්‍රියාව සම්බන්ධ විනය හා නීතිමය පරීක්ෂණ අතරතුර හා අදාළ ක්‍රියාව වාර්තා කිරීමේදී චෝදනා කිරීමේදී ඇතුළු සියලුම අදාල ක්‍රියාවලින්හිදී ස්ව -කැමැත්තෙන් තෝරා ගත් උපදේශකයෙකුගේ උපදෙස් සහ සහය ලබාගැනීම;

ආයතනයේ විනය පටිපාටිය හා අධිකරණ පටිපාටිය, අපරාධ විමර්ශනය අතරතුර අදාල අංශ වල බලපෑමකින් තොරව මානව හිමිකම් ලබා ගැනීමේ හා තම ආගම ඇදහීමේ අයිතිය.

මෙම අයිතීන් සඳහා , ආගම, ජාතිය, වර්ණය, උපන් ස්ථානය,ගෝත්‍රය, වයස, ලිංගික අනන්‍යතාවය, අබාධිත බව, ලිංගික දිශානුයෝජනය, පවුලේ තත්වය, ගර්භනී බව, ජානමය චරිත ලක්ෂණ, සෙබල තත්වය, ගෘහස්ත හිංසන පීඩිත තත්වය, හෝ අපරාධයක් සඳහා වරද කරු වීම බල නොපාන අතර එමෙන්ම අදාළ අපරාධය විශ්ව විද්‍යාල භූමියේ හෝ ඉන් පිටත හෝ පිටරට ඉගෙන ගනිමින් සිටියදී වුවක්ද යන්න අදාල නොවේ.

විශ්ව විද්‍යාල පොලිසියට හෝ මුර සේවයට, ප්‍රාදේශීය පොලිසියට සහ / හෝ පළාත් පොලිසියට වාර්තා කිරීමට ඔබට අයිතිය ඇත. එමෙන්ම ආයතයට වාර්තා නොකිරීමට, ආයතනය විසින් සිද්ධිය වාර්තා කිරීම නිසා විරෝධතාවය පල කරයි නම් එයින් ආරක්ෂා වීමට සහ / හෝ ඔබගේ ආයතනයෙන් සහය හා සම්පත් ලබා ගැනීමට අයිතිය ඇත.